# ප්‍රධාන ප්‍රතිගැනුම් ගිවිසුම

මෙම ගිවිසුම ...................... ........... මස ............. දින බලයලත් ප්‍රමුඛ නියෝජිතයෙකු වශයෙන් .................., ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි ලිපිනය ඇති ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සමාගමක් වන ..................................(ලියාපදිංචි අංකය............) (මෙතැන් සිට නියෝජිතයා වශයෙන් සඳහන් කෙරෙන අතර අනුප්‍රාප්තිකයන් සහ භාරකරුවන් පත් කර ගැනීමේ බලය එයට අත් වේ.) සහ ............................................. (ජා.හැ. අංක..................) දරන ................................ (මෙතැන් සිට ,ගනුදෙනුකරුවාමයනුවෙන් හැඳින්වෙන අතර අනුප්‍රාප්තිකයන් සහ භාරකරුවන් පත් කිරීමේ බලය ගනුදෙනුකරුවාට ලැබේ.) අතර ඇති කර ගැනේ. (තනි වශයෙන් පර්ශ්වය ද එක් ව ගත් කල පාර්ශ්ව).

## 1. අර්ථ නිරූපණය

මෙම ගිවිසුම ප්‍රකාරව, පහත දැක්වෙන යෙදුම් සඳහා මතු දැක්වෙන අර්ථ හිමි වේ.

,**ත්වරක දිනය** - සමාප්ති නිවේදනයට අනුකූල ලෙස ඉදිරිපත් කෙරී ඇති දිනය ත්වරක දිනය වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම ගිවිසුමේ වගන්තිවලට අනුකූලව සමාප්ති නිවේදනයක දැක්වෙන සේවාවක ප්‍රතිඵලයක් වශයෙන් සියලුම ගනුදෙනුවල ප්‍රතිගැනුම්වලට බලපාන දිනය වන්නේ ද ත්වරක දිනයයි.

,**බුන්වත්භාවය පිළිබඳ ක්‍රියාව** - මෙහි අර්ථය වන්නේ කිසියම් පාර්ශ්වයකට අදාළ ව (ස) එම පාර්ශ්වයට සිය ණය ගෙවා ගැනීමට නොහැකි වීම සහ සිය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ ණය පැවතීම (සස) එම පාර්ශ්වය හෝ අදාළ පාර්ශ්වයට අයත් දේපොළවල මූර්තමය කොටසක් වෙනුවෙන් කිසියම් භාරකරුවෙකු, පරිපාලකයෙකු, ආදායකයෙකු හෝ ඈවරකරුවෙකු හෝ අනුෂාංගික නිලධාරියෙකු පත් කිරීම සඳහා අන්වේෂණයක් කිරීමක්, අනුමැතිය පළ කිරීමක් හෝ අනුඥානුමතියක් පළ කිරීමේ දී, හෝ (සසස) කිසියම් අධිකරණයක් හෝ නෛතික නියෝජිතායතනයක් ඉදිරිපිට බංකොලොත්භාවය, ඈවර කිරීම හෝ අදාළ පාර්ශ්වයේ බුන්වත්භාවයට සම්බන්ධයෙන් හෝ ඒ පිළිබඳ චෝදනා යටතේ පෙත්සමක් ගොනු කිරීම හෝ අර්පණය කිරීමේ දී හෝ ගොනු කිරීමේ සිට දින 30ක් තුළ අහවර හෝ නිෂ්ප්‍රභ නොවූ වෙනත් අනුෂාංගික ක්‍රියාපටිපාටියකි.

,**ගිවිසුම** සියලුම ගනුදෙනු සිය කොටස් බවට පත් කෙරෙන ප්‍රධාන ප්‍රතිගැනුම් ගිවිසුම මෙමඟින් අදහස් කෙරේ.

,**සංශෝධිත ප්‍රතිගැනුම් මිළ** කාණ්ඩය 7 යටතේ ඉදිරිපත් කෙරෙනු අර්ථය ම මීට හිමි වේ.

,**ව්‍යාපාරික දිනය** පොදු ව්‍යාපාරික කටයුතු සඳහා වෙළෙඳ නියෝජිතයෙකු සූදානම් දිනය.

,**ඝී ගිණුම** මෙමඟින් අදහස් කෙරෙන්නේ රාජ්‍ය සුරැකුම්පත් (මබබනීැජමරුම) මධ්‍යම සුරක්ෂිතාගාර පද්ධතියක් සහිත ගනුදෙනුකරුවෙකුගේ ගිණුමක් වන අතර එහි අදාළ යෝග්‍ය සුරැකුම්පත් පවත්වා ගෙන යෑම සිදු වේ හෝ යෝග්‍යතාව පරිදි ඒවා පවත්වා ගෙන යනු ලැබේ.

,**සනාථ කිරීම** මෙහි අර්ථය වන්නේ උපලේඛනය ෂ හි දැක්වෙන ආකෘතිපත්‍රයට අනුකූල ලෙස වෙළෙඳ නියෝජිතයා විසින් සනාථ කරනු ලැබීමයි.

,**පැහැර හැරුම් දර්ශකය** යනුවෙන් අදහස් කෙරෙන්නේ ්බෂර්ධසෘ සහ වාර්ෂික මුදලින් සියයට 2කි.

**,යෝග්‍ය සුරක්ෂිතතාව** මෙයින් අදහස් කෙරෙන්නේ ගනුදෙනුකරුවා විසින් සංස්ථාපනය කිරීම උදෙසා නියෝජිතයා විසින් කලින් කලට නිවේදනය කෙරෙන ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ඕනෑම බිල්පතක්, සන්නිවේශයක් හෝ බැඳුම්කරයක් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වෙනත් කිසියම් ආකාරයක සුරැකුම්පතකි.

**,සමතුල්‍ය සුරැකුම්පත්** ඕනෑම තත්ත්වයකට සාපේක්ෂ වගන්තිය 6 පරිදි ගැනුම් සුරැකුම්පත් සඳහා ආදේශනයක් පැවතීම, එකම ස්වරූපයේ සුරැකුම්පත්, ගැනුම් සුරැකුම්පත්වලට සමාන නාමික අගයක්, තොරතුරු සහ අගයන් ඇති සුරැකුම්පත් මෙනමින් හැඳින්වේ.

**,රෝඩුලෝපය** යෝග්‍ය සුරැකුම්පත් පිළිබඳ සැලකීමේ දී පාර්ශවයන් අතර ඇති වන එකඟතාව මත පදනම් ව වෙළෙඳපොළ අගය සඳහා වට්ටමක් සැපයීම මෙයින් අදහස් කෙරෙන අතර නියෝජිතයෙකු සහ ගනුදෙනුකරුවෙකු අතර ගනුදෙනුවක් සිදු වීමේ දී නියෝජිතයා විසින් සද්භාවයෙන් රෝඩුලෝපය ලබා දීමේ හැකියාව ඇත.

**,ආදායම** ගැනුම් සුරැකුම්පත්වලට අදාළ ව නිකුත් කරන්නා විසින් කූපන්පත්, පොලී අනුපාත, ලාභාංශ හෝ වෙනත් ආකාරයක ගෙවීම් සිදු කිරීම මෙයින් අදහස් කෙරේ. (ප්‍රධාන ගෙවීම්වලට අතිරේක වශයෙන් කෙරෙන ගෙවීම්)❑

**,ඛණසෘ** යනුවෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා රුපියල් ය.

**,වෙළෙඳපොළ වටිනාකම** කිසියම් සුරැකුම්පතකට අදාළ ව, එවැනි සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළේ ඇති වටිනාකම හෝ එවැනි වටිනාකමක් වෙළෙඳපොළේ නැති අවස්ථාවක දී සනාථ කිරීම තුළ සටහන් වන ආකාරය අනුව එය නිර්ණය කරනු ලැබේ.

**,ණය පැහැර හැරීම පිළිබඳ නිවේදනය** ණය පැහැර හැරීමේ අවස්ථාවක දී පැහැර නොහරින ලද පාර්ශ්වය විසින් පැහැර හැරීමේ පාර්ශ්වය වෙත නිකුත් කරනු ලබන නිවේදනය මින් අදහස් කෙරේ.

**,අභවර අවස්ථාව පිළිබඳ නිවේදනය** අභවර අවස්ථාවක් එළඹුණු අවස්ථාවේ දී ණය පැහැර නොහැරීමේ පාර්ශ්වය විසින් සෙසු පාර්ශ්වය වෙත කරනු ලබන නිවේදනය මින් අදහස් කෙරෙන අතර එම නිවේදනය මඟින් සුදුසු ත්වරක දිනයක් සහ අභවර ගාස්තු දිනයක් දැනුම් දෙනු ලැබේ.

**,ගැනුම් දිනය** අදාළ සනාථ කිරීම තුළ සඳහන් කෙරෙන දිනය මින් අදහස් කෙරේ.

**,ගැනුම් මිළ** අදාළ සනාථ කිරීම තුළ සඳහන් කෙරෙන මිළ මින් අදහස් කෙරේ.

**,ගැනුම් සුරැකුම්පත්** යනුවෙන් මෙහිදී හැඳින්වෙන්නේ අදාළ සනාථ කිරීම මඟින් සඳහන් කරන ලද සුරැකුම්පත් වන අතර වගන්ති 06 ප්‍රකාරව කිසියම් ආදේශන යෝග්‍ය සුරැකම්පත් ද මීට අන්තර්ගත විමට හැකිය.

**,ප්‍රතිගැනුම් දිනය** අදාළ සනාථ කිරීම මඟින් සඳහන් කෙරුණු දිනය මින් අදහස් කෙරේ.

**,ප්‍රතිගැනුම් මිළ** අදාළ සනාථ කිරීම මඟින් සඳහන් කෙරුණු මිළ මින් අදහස් කෙරේ.

**,ප්‍රතිගැනුම් ගනුදෙනුව** අදාළ සනාථ කිරීම මඟින් ඉදිරිපත් කෙරුණු කොන්දේසිවලට වගන්තිවලට යටත් ව යෝග්‍ය සුරැකුම්පත් **(ගැනුම් සුරැකුම්පත්)** ගනුදෙනුකරුවා වෙත එකඟ වන මිළක් **(ගැනුම් මිළ)** යටතේ එකඟ වන දිනක **(ගැනුම් දින)** අලෙවි කිරීම සඳහා නියෝජිතයා එකඟ වෙමින් සිදු වන

ගනුදෙනු මෙනමින් හැඳින්වෙන අතර මෙහිදී ගනුදෙනුකරුවා සමකාලික ලෙස ගැනුම් සුරැකුම්පත් නියෝජිතයා වෙත එකඟවන මිළක් **(ගැනුම් මිළ)** යටතේ එකඟ වන දිනක දී **(ගැනුම් දින)** අලෙවි කිරීමට එකඟ වේ.

**,ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනුව** මෙයින් අදහස් කෙරෙන්නේ යෝග්‍ය සනාථ කිරීමක් යටතේ නියමිත වගන්තිවලට අනුකූල ලෙස යෝග්‍ය දිනයක යෝග්‍ය ගැනුම් මිළක් යටතේ ගනුදෙනුකරුවකු විසින් ගැනුම් සුරැකුම්පත් නියෝජිතයෙකු වෙත අලෙවි කිරීමට වන එකඟතාව වන අතර යෝග්‍ය ප්‍රතිගැනුම් මිළක් යටතේ යෝග්‍ය ප්‍රතිගැනුම් දිනයක දී නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා වෙත ගැනුම් සුරැකුම්පත් ද එලෙස ම අලෙවි කිරීමට එකඟ වීමයි.

**¨,ඛෂර්ධඝෲ** යනු ශ්‍රී ලංකා අන්තර්බැංකු අර්පණ අනුපාතයයි. අදාළ දිනයේ පෙරවරු 11.00ට රොයිටර්ස් තිරයේ ¨,ඛෂර්ධඝෲම පිටුවේ ප්‍රදර්ශනය කෙරෙහි පරිදි මසක කාලයක් සඳහා අන්තර් බැංකු ඇමතුම් මුල්‍ය වෙළෙඳපොළ තුළ දැක්වෙන අනුපාතය මෙහිදී සලකනු ලැබේ.

**,සමාප්ති නිවේදනය** වගන්තිය 7 (සසස) පරිදි ඉදිරිපත් කරන ලද නිවේදනය මෙහිදී සලකනු ලැබේ.

**,සමාප්ති ගෙවුම් දිනය** මෙහිදී අදහස් කෙරෙන්නේ කාණ්ඩය 7 යටතේ ගෙවීමට නියමිත මුදල් ප්‍රමාණය ගෙවිය යුතු දිනය වේ (මෙහි දැක්වෙන දැක්වෙන වගන්තිවලට යටත් ව).

**මගනුදෙනුවම** මෙයින් අදහස් කෙරෙන්නේ ප්‍රතිගැනුම් ගනුදෙනුවක් හෝ ,ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනුවමකි.

මීට අමතරව, අදාළ තත්ත්වයන්ගේ විශේෂිත අවශ්‍යතාවන් නොයෙදීම මත මෙම ගිවිසුමට අනුව❑

(අ) විමර්ශනයේ පහසුව උදෙසා ඒ ඒ කාණ්ඩයන් සඳහා ශීර්ෂ නාමයන් යොදා ඇති අතර මෙම ගිවිසුමේ අන්තර්ගතයට ඉන් බලපෑමක් නොවිය යුතුය.

(ආ) මෙම ගිවිසුමේ කාණ්ඩයන් සඳහා විමර්ශනයන් ප්‍රකාරව ඒ ඒ කාණ්ඩ සඳහා විමර්ශනයන් සිදු විය යුතුය.

(ඇ) එක වචන අර්ථයේ යෙදෙන යෙදුම් අදාළ සංදර්භය අනුව බහු වචන අර්ථයේ ද බහු වචන අර්ථයේ යෙදෙන යෙදුම් එකවචන අර්ථයේ ද භාවිත විය හැකිය. එසේම, පුරුෂ ලිංගික අර්ථයේ යෙදෙන යෙදුම් ද අදාළ සංදර්භය අනුව ස්ත්‍රී ලිංගික සහ නිර්ලිංගික අර්ථයේ ද ස්ත්‍රී ලිංගික සහ නිර්ලිංගික අර්ථයේ යෙදෙන යෙදුම් පුරුෂ ලිංගික අර්ථයේ ද භාවිත විය හැකිය.

(ඈ) කිසියම් නීතිකරණයක් හෝ උපකාරක නීතිකරණයක් විමර්ශනයට බඳුන් වන්නේ නම් අදාළ නීතිකරණය හෝ උපකාරක නීතිකරණය තුළ කලින් කලට සිදු වන වෙනස්කම්, නැවත පැනවීම් හෝ ආදේශිතයන්වලට යටත් වේ.

## 2. ප්‍රතිගැනුම් ගනුදෙනු

(ස) පාර්ශවයන් විසින් ගනුදෙනුවකට එළඹෙන අවස්ථාවේ දී සෑම ගනුදෙනුවක් සඳහා ම බලපැවැත්වෙන වගන්ති ඇතුළත් ව නියෝජිතයා විසින් සනාථ කිරීමක් නිකුත් කළ යුතුය.

(සස) පාර්ශවයන් අතර ඇති කර ගැනෙන ගනුදෙනුවල දී (ප්‍රකාශිත එකඟතාවකට එළඹ නැතිවිටක දී) ප්‍රධාන ප්‍රතිගැනුම් ගිවිසුමට යටත්ව, එහි කොටසක් ලෙස හා එහි ආධිපත්‍යයට අනුකූල ව එම

ගනුදෙනු සිදු විය යුතු අතර එකී සෑම ගනුදෙනුවක් සඳහා ම නිකුත් කෙරෙන සනාථ කිරීම් සහ මෙම ප්‍රධාන ප්‍රතිගැනුම් ගිවිසුම එක්ව ගත් කල තනි ගිවිසුමක් නිර්මාණය කළ යුතුය.

(සසස) කාණ්ඩය 7ට යටත් ව :

(අ) සෑම ප්‍රතිගැනුම් ගනුදෙනුවක දී ම :

(1) ගැනුම් දිනයේ දී, ගැනුම් මිළ ලැබීමට යටත් ව (ගනුදෙනුකරුවාගේ මුදල් ගිණුම මගින් නියෝජිතයා වෙත මුදල් බැර වන පරිදි ගනුදෙනුකරුවා සමග ගිණුමක් ක්‍රියාත්මක වීමේ අවස්ථාවක් ඇති විට) නියෝජිතයා විසින් ගනුදෙනුකරුවාගේ ඝී ගිණුමේ අදාළ ගැනුම් සුරැකුම් පත් හර කිරීම හෝ ගනුදෙනුකරුවාගේ ඝී ගිණුම වෙත අදාළ ගැනුම් සුරැකුම්පත් පැවරීම කළ යුතුය.

(2) ප්‍රතිගැනුම් දිනයේ දී, ගනුදෙනුකරුවාගේ ඝී ගිණුමේ අදාළ ගැනුම් සුරැකුම්පත් බැර කිරීම සඳහා නියෝජිතයා විසින් කටයුතු කළ යුතු වන අතර එසේත් නොමැති නම් අදාළ ගැනුම් සුරැකුම්පත් ගනුදෙනුකරුවාගේ ඝී ගිණුම මඟින් පවරා ගත යුතුය. ඊට අමතරව, නියෝජිතයා සමඟ පවත්වා ගෙන යනු ලබන ගනුදෙනුකරුවාගේ මුදල් ගිණුම වෙත ප්‍රතිගැනුම් මිළ හර කිරීම හෝ මේ කාර්යය සඳහා ගනුදෙනුකරුවා විසින් නිර්දේශ කරනු ලබන වෙනත් ගිණුමක් වෙත පැවරීම හෝ ගනුදෙනුකරුවා සමඟ එකඟ වන පරිදි වෙනත් ප්‍රකාරයකින් ගෙවීම කළ හැකිය.

(3) නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා වෙත ගැනුම් දිනයේ දී ගැනුම් මිළ මත ගැනුම් සුරැකුම්පත් අලෙවි කිරීමේ කාර්ය සඳහා සෑම ප්‍රතිගැනුම් ගනුදෙනුවක්ම සම්බන්ධ වන බව ප්‍රකාශිතව එකඟ වන අතර පිළිගනු ලැබෙන අතර නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා වෙතින් ප්‍රතිගැනුම් මිළක් යටතේ ප්‍රතිගැනුම් දිනයක දී ගැනුම් සුරැකුම්පත් මිළ දී ගැනීමට ද සම්බන්ධ වන බවට ප්‍රකාශිතව එකඟ වන අතර පිළිගනු ලැබේ. එසේම, (සැක හැර ගැනීමේ අර්ථය ඇති ව) එවැනි ගැනුම් සුරැකුම්පත් සඳහා ක්‍රියාත්මක වන සියලුම නෛතික සහ ප්‍රතිලාභාත්මක කරුණු ගැනුම් දිනයේ දී ගනුදෙනුකරුවාට අදාළ ව හිමි විය යුතු වන අතර ප්‍රතිගැනුම් දිනයේ දී නියෝජිතයාට අදාළ ව හිමි විය යුතුය.

(ආ) සෑම ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගිණුමක් සඳහා ම:

(1) ගැනුම් දිනයේ දී, ගනුදෙනුකරුවාගේ ඝී ගිණුම වෙත අදාළ ගැනුම් සුරැකුම්පත් නියෝජිතයා විසින් බැර කළ යුතු වන අතර එසේත් නොමැති නම් අදාළ ගැනුම් සුරැකුම්පත් ගනුදෙනුකරුවාගේ ඝී ගිණුම වෙතින් පැවරුමක් ලෙස ලබා ගත යුතුය. ඊට අමතරව, නියෝජිතයා සමඟ පවත්වා ගෙන යනු ලබන ගනුදෙනුකරුවාගේ මුදල් ගිණුම වෙත ගැනුම් මිළ හර කළ යුතු වන අතර හෝ මෙම කාර්යයන් සඳහා ගනුදෙනුකරුවා විසින් නිර්දේශ කරනු ලබන වෙනත් ගිණුමක් සමඟ එය කිරීම හෝ ගනුදෙනුකරුවා සමඟ එකඟ වන වෙනත් ක්‍රමයක් යටතේ ගෙවීම් කළ යුතුය.

(2) ප්‍රතිගැනුම් දිනයේ දී, ගනුදෙනුකරුවා වෙතින් ප්‍රතිගැනුම් මිළ ලැබීමට යටත් ව ( ගනුදෙනුකරුවාගේ මුදල් ගිණුම මගින් නියෝජිතයා වෙත මුදල් බැර වන පරිදි ගනුදෙනුකරුවා සමඟ ගිණුමක් ක්‍රියාත්මක වීමේ අවස්ථාවක් ඇති විට) නියෝජිතයා විසින් අදාළ ගැනුම් සුරැකුම්පත් ගනුදෙනුකරුවාගේ ඝී ගිණුම වෙත හර කිරීම හෝ ගනුදෙනුකරුවාගේ ඝී ගිණුම වෙත අදාළ ගැනුම් සුරැකුම්පත් පැවරීම කළ යුතුය.

(3) ගනුදෙනුකරුවා විසින් නියෝජිතයා වෙත ගැනුම් දිනයේ දී ගැනුම් මිළ මත ගැනුම් සුරැකුම්පත් අලෙවි කිරීමේ කාර්ය සඳහා සෑම ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනුවක්ම සම්බන්ධ වන බව ප්‍රකාශිතව එකඟ වන අතර පිළිගනු ලැබෙන අතර ගනුදෙනුකරුවා නියෝජිතයා වෙතින් ප්‍රතිගැනුම් මිළක් යටතේ ප්‍රතිගැනුම් දිනයක දී ගැනුම් සුරැකුම්පත් මිළ දී ගැනීමට ද සම්බන්ධ වන බවට

ප්‍රකාශිතව එකඟ වන අතර පිළිගනු ලැබේ. එසේම, (සැක හැර ගැනීමේ අර්ථය ඇති ව) එවැනි ගැනුම් සුරැකුම්පත් සඳහා ක්‍රියාත්මක වන සියලුම නෛතික සහ ප්‍රතිලාභාත්මක කරුණු ගැනුම් දිනයේ දී නියෝජිතයාට අදාළ ව හිමි විය යුතු වන අතර ප්‍රතිගැනුම් දිනයේ දී ගනුදෙනුකරුවාට අදාළ ව හිමි විය යුතුය.

(සඩ) සනාථ කිරීමක් ලැබීමක දී හැර ප්‍රතිගැනුම් ගනුදෙනුවක නිරත ගනුදෙනුකරුවා විසින් හෝ ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනුවක නියැලි නියෝජිතයා විසින් ගැනුම් දිනයේ සිට ප්‍රතිගැනුම් දිනය දක්වා කාලය තුළ ප්‍රතිසංස්ථාපනයක් සඳහා හෝ ගැනුම් සුරැකුම්පත් ඉවත් කිරීම සඳහා කැඳවීමක් කිරීමට හිමිකම් නොලබයි.

## 3. ආදායම

ගැනුම් සුරැකුම්පත්වලට අදාළ ව ආදායමට අදාළ ගෙවීම් ( ,ආදායම් ගෙවීමම) සිදු කරනු ලබන්නේ නිකුතුකරුවා විසිනි.

(ස) ගැනුම් දිනයෙන් පසු ඕනෑම අවස්ථාවක දී සහ ගැනුම් දිනයේ දී හෝ ඊට පෙර ප්‍රතිගැනුම් ගනුදෙනුවක ඟදාතෘ කරුණු අනුව නියෝජිතයාගේ ප්‍රතිලාභය සඳහා අදාළ මුදල අත් විය යුතු අතර ( සැක හැර ගැනීම සඳහා) ප්‍රත්‍යක්ෂ ලෙස එකී මුදලට හිමිකම් පැවතිය යුතුය. මෙවැනි ආදායම් ගෙවීමක් ගනුදෙනුකරුවා වෙත කර ඇත්නම් ගනුදෙනුකරුවා විසින් සමාන මුදලක් ගනුදෙනුකරුවා විසින් එම ව්‍යාපාරික දිනයේ දී ම නියෝජිතයා වෙත ලැබෙන පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය.

(සස) ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනුව යටතේ ගැනුම් දිනයෙන් පසු ඕනෑම අවස්ථාවක දී සහ ප්‍රතිගැනුම් දිනයේ හෝ ඊට පෙර අදාළ මුදල ගනුදෙනුකරුවාගේ ප්‍රතිලාභය සඳහා අය විය යුතු වන අතර මෙවැනි ආදායම් ගෙවීමක් නියෝජිතයාට ගෙවන අවස්ථාවේ දී අදාළ මුදලට සමාන මුදලක් නියෝජිතයා විසින් එම ව්‍යාපාරික දිනයේ දී ගනුදෙනුකරුවා වෙත ලැබෙන පරිදි ගෙවිය යුතු වේ.

## 4. නියෝජනයන්

(1) මතු දැක්වෙන ආකාරවලින් ගනුදෙනුකරුවා නියෝජිතයා වෙත නියෝජනය වනු ලැබේ. ( ගනුදෙනුකරුවා කිසියම් ගනුදෙනුවක් කරා එළැඹෙන විට ගනුදෙනුකරුවා වෙනුවෙන් අදාළ සෑම දිනයක දී ම එම නියෝජනයන් පුනරාවර්තනය වීමට ඉඩ ඇත.)

(ස) මෙම ගිවිසුම මඟින් සහ අදාළ සනාථ කිරීම මඟින් පනවා ඇති වගන්ති අනුව ගනුදෙනුකරුවාහට ගිවිසුම සහ ගනුදෙනු යටතේ ඇති බැඳීම් සම්පූර්ණ කිරීමට සහ එම ගිවිසුමට එළඹීම සඳහා අවැසි යම් හෝ සියලුම බලතල සහ අනුමැතීන් ගනුදෙනුකරුවා අත් කර ගෙන ඇති අතර ගනුදෙනුකරුවා සතුව පූර්ණ බලතල සහ අධිකාරීත්වය පවතී.

(සස) ගනුදෙනුකරුවා විසින් මෙම ගිණුමට සහ ගනුදෙනු සඳහා ප්‍රතිපත්තියක් වශයෙන් මින් ඉදිරියට එළැඹෙනු ඇත.

(සසස) මෙම ගිවිසුම යටතේ ඕනෑම ගනුදෙනුවක් උදෙසා ගනුදෙනුකරුවා විසින් ගෙවා ඇති සියලුම මූල්‍ය වටිනාකම් සඳහා සර්වපථ්‍ය හිමිකරුවා බවට ගනුදෙනුකරුවා පත් වේ.

(සඩ) වටිනාකම් ඇගයුම, බදු සහ ගණකාධිකරණ ගම්‍යාර්ථයන් සහ ඇති විය හැකි මූල්‍යමය වාසි සහ අවාසි මෙන්ම ගනුදෙනුකරුවාගේ මූල්‍යමය තත්ත්වයන් සඳහා ඇති යෝග්‍යතාව යන කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් සහ අත්දැකීමක් (නියෝජිතයාගේ මැදිහත්වීමකින් තොරව

ගනුදෙනුකරුවාගේම නිර්ණය සහ ඇගයීම අනුව හෝ ගනුදෙනුකරුවා විසින් උචිත යැයි සිතනු ලැබූ වෘත්තීය උපදෙසකට අනුව) ගනුදෙනුවලට එළඹීමට පෙර ගනුදෙනුකරුවාට තිබිය යුතු වන අතර ගනුදෙනුකරුවා පූර්ණ දැනුවත්භාවයකින් යුක්ත විය යුතුය.

(ඩ) ගනුදෙනු හා මෙම ගිවිසුම සම්බන්ධ කටයුතුවල දී නියෝජිතයාගේ අදහස් හෝ උපදෙස්වලට ගනුදෙනුකරුවා ප්‍රතිචාර නොදක්වන අවස්ථාවල දී ගනුදෙනුකරුවාගේ ම ඇගයීම මත පදනම් ව ( ගනුදෙනුකරුවා උචිතයැයි සිතූ වෘත්තීය උපදෙස් ද ඇතුළත්ව) ගනුදෙනුකරුවා එක් එක් ගනුදෙනුව සඳහා ඇතුළත් වීමට තීරණය කර ඇතැයි සලකනු ලැබේ❑ සහ

(ඩස) ගනුදෙනුකරුවා ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් යැයි යන තීරණයට එළැඹෙන අතර මතු දැක්වෙන කිසියම් ගනුදෙනුවක පාර්ශ්වකරුවෙකු වීමෙන් ඇති වන බදු ගම්‍යාර්ථයන් තක්සේරු කිරීමේ වගකීම ඔහු ඉදිරියටත් දරනු ඇත.

(2) ගනුදෙනුකරුවා වෙත නියෝජිතයා පහත දැක්වෙන ආකාරයෙන් නියෝජනය වනු ඇත (නියෝජිතයා ගනුදෙනුවක නියැලෙන සෑම දිනකම දී ම මෙම නියෝජනය පුනරාවර්තනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.):

(ස) මෙම ගිවිසුම මඟින් සහ අදාළ සනාථ කිරීම මඟින් පනවා ඇති වගන්ති අනුව නියෝජිතයා හට ගිවිසුම සහ ගනුදෙනු යටතේ ඇති බැඳීම් සම්පූර්ණ කිරීමට සහ එම ගිවිසුමට එළඹීම සඳහා අවැසි යම් හෝ සියලුම බලතල සහ අනුමැතීන් නියෝජිතයා අත් කර ගෙන ඇති අතර නියෝජිතයා සතුව පූර්ණ බලතල සහ අධිකාරීත්වය පවතී.

(සස) නියෝජිතයා විසින් එළැඹුණු ගනුදෙනුවල දී එම ගිවිසුම්වලට අදාළ ව කිසිදු විචක්ෂණාන්විත ප්‍රතිමානයක් හෝ බලාත්මකව ඇති රෙගුලාසියක් උල්ලංඝනය නොවිය යුතුය.

## 5. බදු

එකඟතාවක් ඇතිවීමක දී හැර, මින් ඉදිරියට දැක්වෙන කිසියම් ගනුදෙනුවකට අදාළ සියලු ගෙවීම් රඳවා තැබීමකින් හෝ අපෝහනයකින් තොරව, නිදහස් සහ පැහැදිලි ආකාරයකින් සිදු කළ යුතු වන අතර ඕනෑම ස්වරූපයක බදු හෝ තීරු බදු පැනවීමේ දී, අය කර ගැනීමේ දී, රැස් කර ගැනීමේ දී, රඳවා ගැනීමේ දී හෝ තක්සේරුකරණයේ දී බදුකරණය සම්බන්ධයෙන් බලයක් ඇති අධිකාරියක් මඟින් සිදු විය යුතු අතර එසේ නොමැතිව බදු රඳවා ගැනීම හෝ අපෝහනය සිදු විය යුත්තේ බදුකරණය සම්බන්ධ අධිකාරියක නීතියට සහ පරිචයනයට යටත්වයි. මෙවැනි අවස්ථාවල දී ගෙවීමේ පාර්ශ්වය එවැනි ගෙවීමක් සම්පූර්ණ කිරීමට බැඳී නොසිටින අතර එවැනි රදවාගැනීමක් හෝ අපෝහනයකින් පසු දළ මූල්‍ය අගය ප්‍රතිග්‍රාහක පාර්ශ්වය වෙත ගෙවිය යුතු වේ.

## 6. ආදේශනය

:ස-ගැනුම් දිනය සහ ප්‍රතිගැනුම් දිනය  අතර කාල පරාසය තුළ දී සිදු වන ඕනෑම ප්‍රතිගැනුම් ගනුදෙනුවක දී අදාළ සනාථ කිරීමට අනුකුල ලෙස නියෝජිතයා විසින් වෙනත් යෝග්‍ය සුරැකුම්පත් ආදේශනය කිරීමේ හැකියාව නියෝජිතයාට ඇති අතර සපයා ඇති ගැනුම් සුරැකුම්පත් සඳහා, කෙසේවෙතත්, එබඳු ආදේශක යෝග්‍ය සුරැකුම්පත් සඳහා යටත් පිරිසෙයින් ගැනුම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකමට සමාන වටිනාකමක් තිබිය යුතු වන අතර මූලික වශයෙන් ආදේශනය කරන අවස්ථාවේ දී ආදේශක දිනය අනුව එම වටිනාකම නිර්ණය වේ. ගැනුම් සුරැකුම්පත් ආදේශනය කිරීමට අදාළව ගනුදෙනුකරුවා වෙත කෙරෙන පැවරුමක් ලෙස මෙම ආදේශනයන් සිදු කළ යුතු වන අතර සමතුල්‍ය සුරැකුම්පත්වල අදාළ මූල්‍ය අගයට සමානව වෙනත් යෝග්‍ය

සුරැකුම්පත් සහ සමකාලික පැවරුම් නියෝජිතයා වෙත සිදු කළ යුතුය. ආදේශනයෙන් පසු, ආදේශක සුරැකුම්පත් හා ගැනුම් සුරැකුම්පත් අතර වෙනස දුරු කිරීම සඳහා ආදේශක සුරැකුම්පත් ගැනුම් සුරැකුම්පත්වලට හා මුල් ගැනුම් සුරැකුම්පත්වලට සමාන තත්ත්වයෙන් පැවතිය යුතු වේ.

ගනුදෙනුකරුවාගේ කෘී ගිණුම හර සහ බැර කිරීමට නියෝජිතයාට ශක්‍යතාව පැවතීම හෝ ගනුදෙනුකරුවාගේ කෘී ගිණුමට පැවරීම් කිරීමට හෝ එම ගිණුමෙන් පැවරීම් ලැබීමට ඒ අනුව නියෝජිතයාට හැකියාව තිබිය යුතුය.

(සස) ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගිණුමකට අදාළ ව ඉහත (ස) හි සඳහන් ආදේශන ප්‍රතිපාදන වලංගු වන්නේ එබදු ආදේශනයක් සඳහා අදාළ සනාථ කිරීම ලැබී ඇත්නම් පම❑.

**7. ණය පැහැර හැරීම/අහවර කිරීමේ අවස්ථාවක දී**

(ස) මෙම ගිවිසුම යටතේ ණය පැහැර හැරීමේ අවස්ථා පිළිබඳ පහතින් දැක්වේ.

(අ) කිසියම් පාර්ශ්වයක් යම් ගෙවීමක් සිදු කිරීමට අපොහොසත් වීම හෝ මෙහිලා සඳහන් කෙරුණු වගකීම් බැඳීම් සම්පූර්ණ කිරීමට නොහැකි වූ විට.

(ආ) භෞතික තත්ත්වයන් යටතේ කිසියම් පාර්ශ්වයක් විසින් මෙහිලා දක්වනු ලැබූ නියෝජනයක් අසත්‍ය බව හෝ නොමඟ යවන සුළු බව අනාවරණය වුවහොත්

(ඇ) කිසියම් පාර්ශ්වයකට අදාළ ව බුන්වත්භාවය සම්බන්ධ තත්ත්වයක දී

(ඈ) ගනුදෙනුකරුවා තනි පුද්ගලයෙකු වී මරණයට පත් වීම හෝ සිහිවිකල් වීම හෝ එසේත් නොමැති නම් අයෝග්‍යභාවයට පත්වීම සහ මරණයක දී, ගනුදෙනුකරුවාගේ සම්පූර්ණ නොකරන ලද මූල්‍ය බැඳීම් මරණයෙන් දින 30ක කාලයක් ඇතුළත් සම්පූර්ණ නොවීම.

(සස) පැහැර හැරීමේ පාර්ශ්වය දැනුවත් ව මූල්‍ය වගකීම් පැහැර හැරීම් සිදු වන අවස්ථාවක දී ඒ පිළිබඳ පැහැර හැරීම සිදු වන පාර්ශ්වය විසින් එසේ නොවන පාර්ශ්වය වෙත දැනුම් දීම වගකීමක් වේ.
(සසස) කිසියම් ණය පැහැර හැරීමක් සිදු වන විට පැහැර හැරීම නොකරන පාර්ශ්ව විසින් පැහැර හැරීමේ පාර්ශ්වය වෙත තෙදින (03)කට නොඅඩු නිවේදනයක් යටතේ සමාප්ති නිවේදනයක් නිකුත් කිරීමේ ඉඩ ඇත.

(සඩ) පැහැර නොහරින ලද පාර්ශ්වය විසින් සමාප්ති නිවේදනයක් නිකුත් කර ඇති විට, සෑම ගනුදෙනුවකටම අදාළ ප්‍රතිගැනුම් දිනය මෙතැන් පටන් ත්වරක දිනය දක්වා (වගන්තිවලට අනුකූල ලෙස සමාප්ති නිවේදනය ලැබේ යැයි සලකනු ලබන දිනයට වඩා කලින් දිනයක් මේ සඳහා නොයෙදිය යුතු වේ.) කඩිනම් කළ යුතුය. සෑම ගනුදෙනුවකටම අදාළ ව ප්‍රතිගැනුම් මිළ වෙනස් කළ යුතු වන අතර නියෝජිතයා විසින් සද්භාවයෙන් යුතුව සිදු කරනු ලබන මුදල් අගය නිර්ණය කිරීමට අනුගාමී ලෙස එය සිදු වේ. සෑම ගනුදෙනුවකටම අදාළ ව ප්‍රතිගැනුම් දිනය ත්වරණය වීම පිළිබඳ සලකා බැලීම සඳහා එම ක්‍රියාමාර්ගය ගැනෙනු ඇත. (මෙසේ සංශෝධනය වන ප්‍රතිගැනුම් මිළ ,සංශෝධිත ප්‍රතිගැනුම් මිළම වශයෙන් සලකනු ලැබේ.)

(ඩ) ත්වරක දිනයක් එළැඹෙන අවස්ථාවක දී (අ) නියෝජිතයා විසින් නිර්ණය කළ යුතු දෑ නම් (1) මෙතැන් පටන් ගැනුම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකම සහ (2) සංශෝධිත ප්‍රතිගැනුම් මිළ සහ (ආ) ගනුදෙනුවලට අදාළව පාර්ශ්වයන් වෙත ඇති බැඳීම් ස්වයංසිද්ධ ව ප්‍රතිස්ථානය කෙරේ.

NSB Fund Management

(1) (අ) සියලුම ප්‍රතිගැනුම් ගනුදෙනු යටතේ වෙළෙඳපොළ අගයන්හි එකතුව සහ (ආ) සියලුම ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනු යටතේ සංශෝධිත ප්‍රතිගැනුම් මිළෙහි එකතුව (මෙම මුදල් එකතුව, ,නියෝජිත මුදලමලෙස සැලකේ.) (ඇ) සියලුම ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගනුදෙනු යටතේ ඇති වෙළෙඳපොළ අගයන්ගේ එකතුවට සහ (ඈ) කිසියම් ප්‍රතිගැනුම් ගනුදෙනුවක් (මෙම මුදල් එකතුව ,ගනුදෙනුකරුවාගේ මුදලම ලෙස සැලකේ.) යටතේ ඇති සංශෝධිත ප්‍රතිගැනුම් මූල්‍ය අගයන්ගේ එකතුවට වඩා ඉහළ වන අවස්ථාවක, ගනුදෙනුකරුවාගේ පාර්ශ්වයෙන් ඇති බැඳීමට අනුකූලව (කාණ්ඩය 7(ඩස)ටයටත්ව) සමාප්ති ගෙවුම් දිනයේ දී අතිරේක මුදල සමාන මුදලක් ගනුදෙනුකරුවා වෙත ගෙවිය යුතුවේ. සහ

(2) ගනුදෙනුකරුවාගේ මුදල් (මෙම ලේඛනයේ කාණ්ඩය 7(ඩ)(ඊ)(1) හි නිර්වචනය කොට ඇති පරිදි) නියෝජිතයාගේ මුදල් (මෙම ලේඛනයේ කාණ්ඩය7(ඩ)(ඊ)(1)හි නිර්වචනය කොට ඇති පරිදි) ඉක්ම වන අවස්ථාවේ දී, නියෝජිතයාගේ පාර්ශ්වයෙන් (මෙම ලේඛනයේ කාණ්ඩය 7(ඩස) ට යටත් ව) අදාළ අතිරේක මුදලට සමාන මුදලක් ගනුදෙනුකරුවාගේ පාර්ශ්වය වෙනුවෙන් සමාප්ති ගෙවුම් දිනයේ දී ගෙවීමට වගකීමෙන් බැඳේ.

(ඩස) ගිණුම් ඒකාබද්ධ කිරීමෙන් වෙනත් කිසිදු අයිතියක් සීමා නොකරමින්, නියෝජිතයා වෙත නිරාකරණය ගැනීමේ හෝ හිලව් කර ගැනීමේ බලය ලැබෙන අතර මෙම ගිවිසුමේ හෝ වෙනත් ආකාරයකින් වෙනත් කිසියම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වුවහොත් නියෝජිතයා (අ) ගනුදෙනුකරුවාට ගෙවීමට නියමිතව ඇති මුදල් ප්‍රමාණයන් තිබුණ ද මෙම ලේඛනයේ කාණ්ඩය 7(ඩ)(ඊ)(1) යටතේ ගෙවීමට නියමිත මුදල (ආ) ගනුදෙනුකරුවාට ගෙවීමට නියමිතව ඇති මුදල් ප්‍රමාණයන් තිබුණ ද මෙම ලේඛනයේ කාණ්ඩය 7(ඩ)(ඊ)(2) යටතේ ගෙවීමට ඇති මුදල් හිලව් කිරීම සඳහා කටයුතු කළ යුතු වේ.

## 8. දැන්වීම්

ඉහත සඳහන් කරනු ලැබූ ලිපිනයට ගනුදෙනුකරුවා වෙත නිවේදන එවනු ලැබීම හෝ නියෝජිතයා වෙත ගනුදෙනුකරුවා විසින් ලිඛිත ව දන්වනු ලැබූ වෙනත් ලිපිනයක් වෙත එවනු ලැබීම සිදු වනු ඇති අතර (ස) පෞද්ගලිකව බාර දුන් අවස්ථාවල දී නියෝජිතයාගේ ව්‍යාපාරික දිනයකදී (බාර දීම ව්‍යාපාරික දිනය හෝ ව්‍යාපාරික වේලාව බැහැර වූ අවස්ථාවක දී නම් ඊළඟ ව්‍යාපාරික දිනය ආරම්භ වන අවස්ථාවේදී) සහ ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරික වේලාවන්හිදී (ව්‍යාපාරික පැය,) (සස) ෆැක්ස් මඟින් යැවීමේ දී, යැවූ බවට සහතිකයක් ලබා ගැනීම සඳහා ව්‍යාපාරික දිනයක දී (ව්‍යාපාරික දිනයක් නොවන දිනයක දී ෆැක්ස් මඟින් යැව්වේ නම්, හෝ යැවීම සිදු වූ දිනය ව්‍යාපාරික වේලාවෙන්ගෙන් බැහැර නම්, ඊළඟ ව්‍යාපාරික දිනයේ ව්‍යාපාරික වේලාවන් ආරම්භ වන විට) සහ (සසස) තැපැල් මඟින් යැවීමේ දී තැපැල් කිරීමේ සිට ව්‍යාපාරික දින දෙකකට පසු එම දැන්වීම් ගනුදෙනුකරුවා වෙත ලැබී ඇතැයි විශ්වාස කරනු ලැබේ.

## 9. ප්‍රමාද වූ ගෙවීම් සඳහා වන පොළිය.

කිසියම් ගනුදෙනුවක් යටතේ හෝ මෙම ගිවිසුම යටතේ කිසියම් පාර්ශ්වයක් කිසියම් ගෙවීමක් සිදු කිරීමට අපොහොසත් වූ අවස්ථාවක දී ,පැහැර හැරුම් දර්ශකයමයටතේ අදාළ පාර්ශ්වය විසින් පොලිය ගෙවීම සිදු කළ යුතු වන අතර අදාළ ගෙවීම සැබෑ වශයෙන්ම අනෙක් පාර්ශ්වය වෙත ලැබෙන දිනය අත් හරිමින් නමුත් නොගෙවා සිටීම ඇරඹූ දිනයේ සිට එම දිනය ද ඇතුළත් ව පොලී ගෙවීම සිදු කළ යුතුවේ. දෛනික සමථායනය ගත වී ඇති සැබෑ දින ගණනට අනුකූල ලෙස මෙම පොලිය ගණනය කළ යුතු වේ.

**10. අසංක්‍රාම්‍යතාව**

**(ස) මෙම ගිවිසුම යටතේ කිසිදු පාර්ශ්වයක් විසින් සිය අයිතීන් සහ බැඳීම් හුවමාරුව හෝ පැවරීම සිදු නොකළ යුතු අතර එපරිද්දෙන් ම අනෙක් පාර්ශ්වයෙන් පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව තුන්වැනි පාර්ශ්වයක් වෙත අයිතීන් නිර්මාණයක් සිදු නොවිය යුතුය.**

**(සස) අදාළ සනාථ කිරීම මඟින් දැනුම් දීමක් නොකර ඇත් නම් ප්‍රතිගැනුම් ගනුදෙනුවක දී ගැනුම් දිනය සහ ප්‍රතිගැනුම් දිනය අතර කාලයේ දී ගැනුම් සුරැකුම්පත් අලෙවි නොකළ යුතුය.**

**11. නියෝජිතයාගේ බැඳීම/අනුපාතික බලපෑම.**

**(ස) මෙහිලා සඳහන් වන නියෝජිතයාගේ බැඳීම් නියෝජිතයා විසින් ම දැරිය යුතු වන අතර ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලු නීති සහ රෙගුලාසිවලට එම ක්‍රියාකාරකම් යටත් විය යුතුය.**

**(සස) නියෝජිතයාට මෙහිලා සඳහන් කෙරුණු බැඳීම් ඉටු කිරීමට කිසිසේත් ඉටු කිරීමට නොහැකි වන හෝ අප්‍රායෝගික අනුපාතික බලපෑමක් හෝ රාජ්‍යාධිකාර ක්‍රියාවක් හේතුවෙන් මෙය සිදු වන විට නියෝජිතයාට තවදුරටත් කිසිසේත් ඉටු කිරීමට නොහැකි හෝ අප්‍රායෝගික තත්ත්වය පහව යන තුරු එවැනි බැඳීම් ඉටු කිරීම අත්හිටුවිය යුතු වන අතර කිසිදු පොලියක් හෝ වෙනත් ගෙවීමක් (මෙම බැඳීම් සඳහා මෙවැනි අත්හිටුවීමකට අදාළ නොවන කිසියම් පොලී මුදලක් හෝ වෙනත් ගෙවීමක් හැර) අත්හිටුවන ලද බැඳීම් සඳහා අත්හිටුවීම ක්‍රියාත්මක වන කාල සීමාව තුළ දී නොගෙවිය යුතු වේ❑ කිසියම් පැහැර හැරීමේ හෝ ඇවර කිරීමේ සිද්ධියක දී නිරාකරණය කර**

**ගැනීම හෝ හිලව් කිරීමක් සඳහා නියෝජිතයාට අදාළ බැඳීමේ වටිනාකම ඇතුළත් කර ගැනීමේ අරමු❑න් අදාළ බැඳීම ක්‍රියාවට නැංවීමට නියමිත බව නියෝජිතයා විසින් නිවේදනය කිරීමේ අයිතිය පවතී.**

**12. පාලන නීතිය/අධිකරණපාත්‍රතාව සඳහා සැල කිරීම.**

**ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නීතිය මඟින් මෙම ගිවිසුම සහ සියලුම ගනුදෙනු පාලනය විය යුතු අතර ශ්‍රී ලංකාවේ අනන්‍ය අධිකරණපාත්‍රතාව වෙත අදාළ පාර්ශ්ව යොමු වනු ඇත.**

**මෙම ලේඛනයේ පළමු පිටුවේ සඳහන් කොට ඇති දිනයේ පටන් ක්‍රියාත්මක වන පරිදි මතු දැක්වෙන අදාළ දිනයන්හි දී පාර්ශ්වයන් විසින් මෙම ලේඛනය ක්‍රියාවට නැංවීම සඳහා සාක්ෂි වශයෙන් අත්සන් පිහිටුවන ලදී.**

| | |
|---|---|
| **වෙතින් :..........................................................................** | **වෙතින් :..........................................................................** |
| **නම :** | **නම :** |
| **පදවි නාමය:** | **පදවි නාමය:** |
| **දිනය:** | **දිනය:** |

**(ගනුදෙනුකරුවා තනි පුද්ගලයකු වන අවස්ථාවකදී)**

| | |
|---|---|
| **අත්සන(අත්සන්): .......................................................** | **.......................................................................................** |
| **නම:..........................................................................** | **නම:...........................................................................** |
| **සාක්ෂිය :** | **(නම) :..........................................................................** |
| **සාක්ෂිය :** | **(නම) :..........................................................................** |
| **දිනය : .......................................................................** | |

**(ගනුදෙනුකරුවා සංස්ථාපිත වන කල)**

**.................................................................. සීමාසහිත සමාගමේ ප්‍රසිද්ධ මුද්‍රාව කොළඹ දී මෙම ලේඛනයේ පිහිටුවන ලද අතර මුද්‍රා පිහිටුවීම සහ අධ්‍යක්ෂවරුන් අත්සන් යෙදීම ............................................................................. අධ්‍යක්ෂ සහ ............................................... අධ්‍යක්ෂ ඉදිරියේ සිදු කෙරුණු අතර ඔවුන් විසින් මෙහිලා මුද්‍රා තැබීම සාක්ෂි දරනු ඇත.**

**සාක්ෂි :**

**1.**

**2.**

**හෝ**

**අත්සන් කළේ ........................................................... බලයලත් අත්සන්කරු සමාගම වෙනුවෙන්, කොළඹ දී**

**අත්සන**

**සාක්ෂි**

**1.**

**2.**

උපලේඛනය 1

නියෝජිතයාගේ ලිපි ශීර්ෂය

ණයහිමියා : (ගනුදෙනුකරුවාගේ නම)
ණයගැතියා: (නියෝජිතයාගේ නම)
දිනය :
විෂය : ගනුදෙනුව (විමර්ශන අංකය: ( )

ප්‍රිය මහත්වරුනි,

මෙම ලිපියේ අරමුණ වන්නේ (ප්‍රධාන ප්‍රතිගැනුම් ගිවිසුම වෙනුවෙන් අප (ගිවිසුම්) අතර සනාථ කිරීමක් මෙමගින් සංස්ථාපනය කෙරේ.) පහතින් දැක්වෙන කොන්ත්‍රාත් දිනයේ දී අප අතර ඇති කර ගැනුණු ප්‍රතිගැනුම් ගනුදෙනුවේ වගන්ති සහ කොන්දේසි පනවා ගැනීමයි.

මෙම සනාථ කිරීම ගිවිසුම කෙරෙහි ප්‍රතිපූරණයක් සපයන අතර, ගිවිසුමේ කොටසක් මෙන්ම ගිවිසුමට විෂය වන්නකි❑ ගිවිසුමෙහි අන්තර්ගත සියලුම ප්‍රතිපාදන මගින් පහත දැක්වෙන ප්‍රකාශිත විකරණ හැර මෙම සනාථ කිරීම පාලනය කරනු ලැබේ. ගිවිසුම තුළ අර්ථ නිරූපණය කර ඇති සහ සනාථ කිරීම තුළ භාවිත කර ඇති වදන් සහ වාක්‍ය ඛණ්ඩ ගිවිසුමෙහි මෙන්ම මෙහිදී සමාන අරුත් ලැබිය යුතුය.

මෙම සනාථ කිරීම මඟින් ගනුදෙනුව කෙරෙහි සාක්ෂ්‍ය සම්පාදනය කෙරෙන අතර රාජ්‍ය සුරැකුම්පත්හි මධ්‍යම සුරක්ෂිතාගාර පද්ධතයේ වාර්තාගත විය යුතුය.

1. කොන්ත්‍රාත්තු දිනය:
2. ගනුදෙනුවේ ස්වභාවය: (ප්‍රතිගැනුම් ගනුදෙනුව) (ප්‍රතිවර්තන ප්‍රතිගැනුම් ගිවිසුම) 3. ගැනුම් සුරැකුම්පත්:
   (තොරතුරු *ඇද ශීර්ෂ* සහ වෙනත් අංක)
4. ගැනුම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකම :
5. ගැනුම් දිනය/වටිනාකම් දිනය:
6. ගැනුම් මිළ/පොලී අනුපාතිකය:
7. ප්‍රතිගැනුම් දිනය/පරිණත වන දිනය:
8. ප්‍රතිගැනුම් මිළ/පොලී අනුපාතිකය:
9. සුරැකුම්පත් ආදේශනයට ඉඩ ඇත (ඔව්/නැත):
10. සුරැකුම්පත් ප්‍රතිපූරණයට ඉඩ ඇත. (ඔව්/නැත.):
11. සුරැකුම්පත් නිහරණයට ඉඩ ඇත. (ඔව්/නැත):
12. සුරැකුම්පත් ක්‍රයතාව සඳහා ඉඩ ඇත. (ඔව්/නැත): නැත
13. අතිරේක වගන්ති:
    (ස) කිසියම් සුරැකුම්පතක වෙළෙඳපොළ වටිනාකම නිර්ණය කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක දී පාර්ශවයන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ අනුපාතයන් මත සිදු විය යුතු අතර නොඑසේ නම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ සුරැකුම්පත් සඳහා නියම කරන ලද අනුපාත අනුව සිදු විය යුතුය.
    (සස) පරිණත උත්පාදන මුදල්/පොලී මුදල් අයදුම්පත්‍රයේ සඳහන් කොට ඇති ඔබගේ මුදල් ගිණුම වෙත හෝ ලිඛිතව අප වෙත නියමිත කල දී අප වෙත දැනුම් දෙනු ලැබූ වෙනත් ගිණුමක් වෙත බැර කෙරේ.
14. සනාථ කිරීමේ ඇති දෝෂ: සනාථ කිරීමක් ලැබුණු දිනයේ සිට දින දෙකක් (02) ඇතුළත ඔබ විසින් මෙම සනාථ කිරීම්වල කිසියම් දෝෂයක් වෙතොත් ඔබ විසින් ලිඛිතව එය අප වෙත දැනුම් දිය යුතුය.

අපගේ ෆැක්ස් අංකය:........................................................ අපගේ ටෙලෙක්ස් අංකය:..................................................

ප්‍රලේඛන විමසුම් සඳහා අපගේ දුරකථන අංක:........................................................

ස්තුතියි,

.................................
වෙනුවට
(නියෝජිතයාගේ නම) දිනය .................................
1ම වරසක 2015